# 'සාම ලැදි' යුරෝපයේ යුදවාදය

ඔක්තෝබර් 13 වෙනි සඳුදා 'ලක්බිම' පත්‍රය හා සාකච්ඡාවකට එක් වූ පාරිසරික කටයුතු පිළිබඳ ඇමති චම්පික රණවක බටහිර බලවේගයන්ට එරෙහිව විවෘතව යුද්ධ ප්‍රකාශ කොට තිබිණ. ඔහුගේම වචන උපුටා දක්වතොත් අභියෝගය මෙසේ යː

*''අද ලෝකය වෙනස් වෙලා. ඇමරිකාවට හෝ බටහිර බලපෑම්වලට අපි දැන් බිය විය යුතු නැහැ. ඔවුන්ගේ සම්බාධකවලට ද අපි බිය විය යුතු නැහැ. අද ලෝකයේ සල්ලි තියෙන රටවල් ඕන තරම් තියෙනවා. ඇමරිකාව අපිට ආයුධ දෙන්නේ නැතිනම් වෙනත් රටකින් ආයුධ ගන්න හැකියාව තියෙනවා. බටහිර බලවේගවල පදයට නටපු කාලයක් තිබුණා. දැන් ඒ කාලය ඉවරයි.''*

ජාතිකානුරාගයේ දෘෂ්ටිකෝණයෙන් බලතොත් නැගිට අත් පොළසන් දිය යුතු අභීතභාවයක් මේ කතාවෙහි ඇතැයි ඕනෑ නම් යමෙකුට තර්ක කළ හැකිය. නමුත් පරහකට ඇත්තේ මේ කතාවෙන් ඉල්ලා සිටින තරමට ප්‍රායෝගික සම්බාධක 'බටහිර පරසතුරු බලවේග' විසින් මේ දක්වාම ශ්‍රී ලංකා රජයට නොපැනවීමයි. ඊට පරස්පර යථාර්ථයන් විසින් පෙන්නුම් කරන්නේ 'ඊළමට' නොලැබෙන බටහිර අනුග්‍රහයක් ඒකීය ලංකාවක් පතා යුද වදින රාජපක්ෂ ආණ්ඩුවට ලැබෙන බවයි. 'රට බෙදන බටහිර කුමන්ත්‍රණ ගැන දකුණේ රජයන භීතිකාව කොතරම් බලසම්පන්න වුවද පළමු ඊළම් යුද්ධයේ පටන් දැන් ඇවිළ යන සිව්වෙනි ඊළම් යුද්ධය දක්වා විෂයමූල සාක්ෂි විසින් පෙන්නුම් කරන බොරු කළ නොහැකි ඇත්ත එයයි.

ඉකුත් සතියේ දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද බ්‍රිතාන්‍ය නිදසුන දෙසට මොහොතකට හැරෙමු. එය විසින් පෙන්නුම් කරන ලද්දේ අවි අපනයනය පිළිබඳ යුරෝපයේ පවතින ඇතැම් නීතිමය සීමා ශ්‍රී ලංකාවට සපයනු ලබන යුද ආධාර අවුරාලීමට ඉවහල් වී නැති බවයි. 2007 අවුරුද්දේ මැයි 02 වෙනිදා ශ්‍රී ලංකාව පිළිබඳ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ පැවැති සුප්‍රකට විවාදයේදී කම්කරු පක්ෂ මන්ත්‍රිනි ජොආන් රුඩොක් මෙසේ කීවායː *''මා විසින් කරන ලද විමසීම් විසින් අනාවරණය කර ඇත්තේ දැනට සංඛ්‍යා ලේඛණ සපයනු ලැබ ඇති අවසාන කාර්තුව තුළ පමණක් ස්ටර්ලින් පවුම් මිලියන 7ක් වටිනා අවි අපනයන බලපත්‍ර ශ්‍රී ලංකාව සඳහා නිකුත් කර ඇති බවයි. උදාහරණ වශයෙන් මෙකී බලපත් සන්නද්ධ රථ, බර මෙෂින් තුවක්කු සඳහා වන අමතර කොටස්ද, ප්‍රහාරක ගුවන් යානා සඳහා අවශ්‍ය භූමි උපකරණ සහ සන්නිවේදන උපකරණ ඇතුළු වෙනත් විවිධ උපකරණ සඳහා වන අංගෝපාංග මෙන්ම සුළු අවි සඳහා භාවිතා කෙරෙන පතොරොම් ආදිය සඳහා නිකුත් කළ ඒවායි. මේ සියල්ල පවතින ගැටුම සඳහා උපයෝග කොටගත හැකියැයි සිතිය හැකි යුදමය උපකරණ වේ. අපගේ ආණ්ඩුව, යුරෝපා සංගමය මෙන්ම ජාතිකවත් පිළිගත් නිර්ණායකයන් හා නීතීන්ට යටත්ව මෙම අපනයන බලපත් සඳහා එකඟතාව ලබා දී ඇති බැව් මම දනිමි. මෙහිදී වැරදි ක්‍රියා පිළිවෙතක් ගැන චෝදනාවක් මතු නොකෙරේ.'' (02 May 2007 /British Hansard - Column 1591 - 1595)*

'සිය ඡන්ද කොට්ඨාශයේ ජීවත්වන දෙමළ ජනයාගේ බලපෑම හේතුවෙන්' ශ්‍රී ලංකාවට යුද ආධාර සැපයීම පිළිබඳ ප්‍රශ්නය මතුකරන ලේබර් පක්ෂ මන්ත්‍රීවරිය කොතරම් සූක්ෂම ලෙස මගහැර යාමට උත්සාහ කළ ද, දීර්ඝ කාලීන ගැටුම් පවතින ශ්‍රී ලංකාවට කරනු ලබන යුදමය සැපයුම් අවි අපනයනය පිළිබඳ යුරෝපා සංගමයේ පිළිගත් නිර්ණායකයන්ට පටහැනිව යන බවට පැහැදිලි තර්කයක් මතුකළ හැකිය. නමුත් මෙහිදී ඒ චෝදනාව යමෙක් විසින් නගන්නේ නම් ඊට තනිව මුහුණදීමට සිදුවීමේ අවදානමක් බ්‍රිතාන්‍යයට මතු නොවේ. ඊට හේතුව, ලංකාවට යුද ආධාර සැපයීම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යයට නොදෙවෙනි උද්‍යෝගීමත් දායකත්වයක් දක්වන වෙනත් සාමාජික රටවල් යුරෝපා සංගමය තුළ හිඟ නැති බැවිනි. චෙක් ජනරජය කදිම නිදසුනකි.

**අපි වෙනුවෙන් 'චෙක් අවි'**

පැරණි චෙකොස්ලොවැකියාව වනාහී එවකට වෝර්සෝ සම්මුතියට අයත් රටවල් අතරේ සිටි දෙවෙනි විශාලතම අවි නිෂ්පාදක රාජ්‍යයයි. නමුත් නිරවි යුද වකවානුව අවසන් කරමින් 1993 දී චොකොස්ලොවැකියාව බෙදී විසිරී යාමෙන් පසු චෙක් යුද අවි කර්මාන්තය තීරණාත්මක පසුබෑමකට ලක්විය. ස්ලොවැකියාවෙන් වෙන්වීමෙන් පසු බිහි වූ නව චෙක් ජනරජය ආරක්ෂක කර්මාන්තය ඉලක්ක කොට දැවැන්ත ප්‍රතිව්‍යුහකරණ සැළැස්මක් ක්‍රියාවට නංවනු ලැබුවේ ඒ හේතුවෙනි. එතෙක් රාජ්‍ය අයිතිය යටතේ පැවැති මහා පරිමාණ යුද අවි කර්මාන්ත ක්ෂේත්‍රය ඒ යටතේ පෞද්ගලීකරණය කෙරුණු අතර අලුතින් මතු වූ පෞද්ගලික සමාගම්වලින් සමන්විත ආරක්ෂක ක්ෂේත්‍රයේ පර්යේෂණ, සංවර්ධන, නිෂ්පාදන සහ අලෙවිකරණ ක්‍රියාදාමයන් දිරි ගැන්වීම සඳහා 1997 ජූනි මාසයේදී 'ආරක්ෂණ කර්මාන්ත සංගමය'ක් ස්ථාපිත කරන ලදී. ඇත්තෙන්ම ප්‍රායෝගිකව සිදුවූයේ පැරණි චෙකොස්ලොවැකියාව සමයේ අවි අපනයනය සම්බන්ධයෙන් පැවැති දැඩි සදාචාරාත්මක පිළිවෙත වෙනුවට වඩා ලිහිල් නිදහස් වෙළෙඳපොළ ආකල්ප වර්ධනයට පසුබිම නිර්මාණය කිරීමයි.

1999 මාර්තුවේදී නේටෝ සාමාජිකත්වය ලබාගත් චෙක් ජනරජය යුරෝපා සංගමයේ පූර්ණ සාමාජික රාජ්‍යයක් බවට පත් වූයේ 2004 මැයි 01 වෙනිදා ය. නමුත් 'අවි අපනයනය පිළිබඳ යුරෝපා සංගමයේ ආචාර ධර්ම පද්ධතිය' *(European Union Code of Conduct on Arms Exports)* චෙක් ජනරජය විසින් පිළිගන්නා ලද්දේ ඊට හය අවුරුද්දකට කලිනි. ඒ අනුව අවි අපනයනය පිළිබඳ යුරෝපා සංගමයේ සාමාජික රාජ්‍යයන් විසින් පිළිගත් පොදු නිර්ණායක අනුව ක්‍රියා කිරීමට චෙක් ජනරජය 1998 සිටම බැඳී සිටියේය. නමුත් තුන්වෙනි ඊළම් යුද සමයේ සිටම ශ්‍රී ලංකා රජයේ යුද ක්‍රියාදාමයට අවශ්‍ය යුදමය සහාය නොමසුරුව සැපයීමට මෙමගින් බාධා වූ බවක් නොපෙනේ.

'ජේන්ස් ඩිෆෙන්ස් වීක්ලි' සඟරාවේ 2000 ජූලි 19 වෙනිදා කලාපයේ පළ වූ වාර්තාවට අනුව ශ්‍රී ලංකා රජයේ හමුදාවන් සඳහා වූ T-55 යුද ටැංකි 40ක්ද, VT55 සන්නද්ධ රථ 16ක්ද, ජංගම අලුත්වැඩියා රථ තුනක්ද, මිලි මීටර් 122 රොකට් උණ්ඩ 10,000ක්ද, මිලි මීටර් 122 RM 70 මල්ටි බැරල් රොකට් ලෝන්චර් 16ක්ද සඳහා වූ ඇණවුම් චෙක් ජනරජය විසින් එම වසරේදී භාරගන්නා ලදී. *(Sri Lanka Army Inspects Czech Main Battle Tanks - Janes Defence Weekly / 19 July 2000)* දෙමළ ගරිල්ලන්ට එරෙහිව යුද වැදී සිටි ශ්‍රී ලංකා රජයේ හමුදාවන්ට මෙකී සුවිශාල අවි සැපයුම් කරනු ලබන විටත් චෙක් ජනරජය බටහිර බලවේගයන්ගේ ප්‍රධානතම යුද සන්ධානය වූ නේටෝ සංවිධානයේ සාමාජික රාජ්‍යයක් වීමට අමතරව, යුරෝපා සංගමයේ අවි අපනයන පිළිවෙත පිළිබඳ පොදු ලිඛිත එකඟතාව නිල වශයෙන් පිළිගත් රාජ්‍යයක්ද විය.

ඊළම් යුද්ධයේදී චෙක් ජනරජය වෙතින් පිරිනැමෙන යුද ආධාර පිළිබඳ කතාන්දරය එතෙකින් නොනවතී. අවි අපනයනයන්

පිළිබඳ දත්ත ඇතුළත් සාමාන්‍ය තොරතුරු ලේඛනයක් වාර්ෂිකව පළ කිරීමට 2001 අවුරුද්දේ සිට චෙක් ජනරජය ක්‍රියා කළේය. නමුත් යුරෝපා සංගමයේ සාමාජික රටවල් විසින් පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව අවි අපනයනය පිළිබඳ වාර්ෂික දත්ත සම්පිණ්ඩණ වාර්තාවක් පළ කිරීම චෙක් ජනරජය විසින් ආරම්භ කරන ලද්දේ 2004 දීය. එම වසරේ දෙසැම්බරයේදී නිකුත් කළ අදාළ වාර්තාවට අනුව චෙක් ජනරජය විසින් ශ්‍රී ලංකාව සඳහා 2004 වසරේ දී යුරෝ 1,403,000ක් වටිනා ආරක්‍ෂණ අපනයන බලපත් 33ක් අනුමත කොට තිබේ. එයින් භාවිතයට ගත් බලපත්වල වටිනාකම යුරෝ 686,000කි. මෙය 2003 වසරේදී ශ්‍රී ලංකාව සඳහා අනුමත කරන ලද යුදමය අපනයනයන්ට සාපේක්‍ෂව බලතොත්, පස් ගුණයකින් වැඩිවීමක් පෙන්නුම් කරයි. *(Annual Report on Export Control of Military Equipment and Small Arms for Civilian Use in the Czech Republic in 2004 / 22-24 පිටු)*

2007 ජූලි 11 වෙනිදා චෙක් ජනරජය විසින් නිකුත් කරන ලද අංක 773/2007 ආඥාවට යටත්ව, ඉදිරිපත් කරන ලද 2006 වසර සඳහා වූ චෙක් අවි අපනයන වාර්තාව වනාහී මේ ලිපිය ලියන මොහොත වනවිට නිකුත් කොට ඇති ඒ වර්ගයේ අවසන් වාර්ෂික වාර්තාවයි. යුරෝපා සංගමයේ සාමාජික රටවල් බැඳීගත් 'අවි අපනයනය පිළිබඳ ආචාර ධර්ම පද්ධතියට' ඇති සිය කැපවීම ගැන අවධාරණයන් සහිතව ඇරඹෙන මෙම වාර්තාව විසින් පෙන්නුම් කරන ආකාරයට 2005 වර්ෂය තුළදී ශ්‍රී ලංකාවට සපයන ලද සමස්ත යුරෝපීය අවි විකුණුම්වලින් 83.3%ක වෙළඳ පොළ පංගුවක් නියෝජනය කරනු ලැබ ඇත්තේ චෙක් ජනරජය විසිනි. *(Annual Report on Export Control of Military Equipment and Small Arms for Civilian Use in the Czech Republic in 2006 / 11 පිටුව)* අදාළ වාර්තාවට අනුව සිව්වෙනි ඊළම් යුද්ධය පුපුරා ගිය 2006 වසර සඳහා ශ්‍රී ලංකාවට අනුමත කරන ලද චෙක් ආරක්‍ෂණ අපනයන බලපත්‍ර 17ක වටිනාකම යුරෝ 1,584,000කි. එයින් භාවිතයට ගත් බලපත්වල වටිනාකම යුරෝ 1,474,000කි. *(ඉහත වාර්තාව /13 පිටුව)* අදාළ සැපයුම්වලින් 95%ක්ම ශ්‍රී ලංකා යුද හමුදාව සඳහා කරන ලද සැපයුම් වේ. වඩා වැදගත් කරුණ වන්නේ මෙකී යුද ආධාර වාර්ෂිකව ක්‍රමානුකූල ලෙස වැඩිවීමක් පෙන්නුම් කිරීමයි.

මේ වනවිට මධ්‍යම යුරෝපය තුළ අංක එකේ ඇමරිකානු අනුගාමික රාජ්‍යයක් වශයෙන් පිළිගැනෙන චෙක් ජනරජය, රුසියාව සීමාකිරීමේ උපායික අරමුණ සහිතව දියත් කර ඇති යුරෝපයේ ඇමරිකානු මිසයිල ආරක්‍ෂණ වැඩ පිළිවෙලෙහි ප්‍රධාන ආධාරක රාජ්‍යයකි. මේ වසරේ අප්‍රේල් මාසයේ රුමේනියාවේ බුකාරෙස්ට් නගරයේ පැවැති නේටෝ සමුළුවේදී චෙක් ජනරජය සහ එක්සත් ජනපදය විසින් ඒකාබද්ධව නිකුත් කළ නිවේදනයකට අනුව දිගුදුර බැලස්ටික් මිසයිල ප්‍රහාරයකින් මධ්‍යම යුරෝපීය රාජ්‍යයන් ආරක්‍ෂා කිරීමේ සටන් පාඨය යටතේ සවි කිරීමට නියමිත එක්සත් ජනපද මිසයිල ආරක්‍ෂණ රේඩාර් පද්ධතිය 2012දී ස්ථාපිත කරනු ඇත්තේද චෙක් ජනරජය තුළ ය. *(Czech Republic, U.S. Agree to Missile Defense Radar Installation - 03.04.2008 / www.america.gov)* මීට අදාළ ගිවිසුමට මේ වසරේ ජූලි 08 වෙනිදා දෙරටෙහි ආරක්‍ෂක බලධාරීහු අත්සන් තැබූහ. එළඹෙන 2009 වසරේ පළමු කාර්තුව සඳහා යුරෝපා සංගමයේ සභාපති ධූරය භාර ගැනීමටද නියමිත මේ උද්‍යෝගීමත් ඇමරිකානු සගයා 2003 දී ශ්‍රී ලංකා රජයේ හමුදාවන් සඳහා කළ සමස්ත යුද සැපයුම්වල වටිනාකම යුරෝ 134,000කි. 2004දී යුරෝ 686,000කි. 2005දී 850,000කි. 2006දී යුරෝ 1,474,000කි. *(ඉහත වාර්තාව /18 පිටුව)*

**ස්ලොවැකියානු හා ස්ලෝවේනියානු නිදසුන්**

පැරණි චෙකොස්ලොවැකියානු රාජ්‍යයේ පංගුකාරයෙකු වශයෙන් සිටි අතීතයේදී සාම්ප්‍රදායික බර අවි නිෂ්පාදනයේ කේන්ද්‍රස්ථානයව පැවැතියේ ස්ලොවැකියාවයි. චෙකොස්ලොවැකියානු ආරක්‍ෂණ කර්මාන්තය තුළ සෘජු රැකියාවන්වල නියුක්තව සිටි 73,000කින් 40,000ක්ම ස්ලොවැකියාව තුළ සේවය කිරීමෙන් චෙක් අවි නිෂ්පාදන කටයුතු සඳහා එවකදී ස්ලොවැකියාව විසින් දක්වන ලද දායකත්වය පැහැදිලි වේ. එහි නිෂ්පාදන ධාරිතාව කෙතරම් වීද යත්, 1950 ගණන්වල සිට 1989 දක්වා වූ කාලය තුළ යුද ටැංකි 20,607ක්ද, සන්නද්ධ ප්‍රහාරක රථ 21,446ක්ද, කාල තුවක්කු පද්ධති 1,737ක්ද නිපදවීමට ස්ලොවැකියානු අවි කර්මාන්ත ශාලා, දායක වී තිබිණ. 1998න් පසු ස්ලොවැකියානු ආරක්‍ෂක කර්මාන්ත ක්‍ෂේත්‍රය වේගවත් නවීකරණ ක්‍රියාදාමයකට පාත්‍ර කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2000 අවුරුද්දේ සමස්ත ස්ලොවැක් ආරක්‍ෂණ අපනයනයන්ගේ වටිනාකම ඩොලර් මිලියන 45ක් දක්වා ඉහළ ගිය අතර ඉන් 62%ක්ම ස්ලොවැක් හමුදාවන් සතු අතිරික්ත අවි අපනයනයන්ගෙන් උපයා ගනු ලැබිණ. *(Arms Production, Exports and Decision Making in Cntral and Eastern Europe - June 2002 / Saferworld )*

බැලූ බැල්මට අදාළ නොවෙතැයි සිතෙන යට කී සංඛ්‍යා දත්ත වැදගත්වන්නේ, පශ්චාත් නිරවි යුද සමයේ ස්වාධීන රාජ්‍යයක් වශයෙන් මතු වූ ස්ලොවැකියානු ජනරජයේ යුද අවි කර්මාන්තයෙහි ස්ථාවර ශක්තිය වටහා ගනු පිණිස ය. නව භූමිකාවට ගැළපෙන පරිදි 2004 මාර්තු 29 වෙනිදා නේටෝ සංවිධානයට නිල වශයෙන් ඇතුළත් වූ ස්ලොවැකියාව, 2004 මැයි 01 වෙනිදා යුරෝපා සංගමයේ පූර්ණ සාමාජික රාජ්‍යයක් බවටද පත් විය.

ශ්‍රී ලංකාවට අදාළ ස්ලොවැකියානු අවි සැපයුම් ඉහළ යාම ඇරඹෙන්නේ සිව්වෙනි ඊළම් යුද්ධයේ ආරම්භයත් සමඟ ය. 2006 වසර සඳහා ස්ලොවැකියානු ජනරජය විසින් නිකුත් කරන ලද යුද අවි අපනයනය පිළිබඳ වාර්ෂික වාර්තාවට අනුව ශ්‍රී ලංකාව සඳහා 2006දී අනුමත කරන ලද අවි අපනයන බලපත්වල සමස්ත වටිනාකම යුරෝ 2,14,766 (ස්ලොවැක් කොරුනා 6,443,000)කි. ප්‍රධාන වශයෙන් සන්නද්ධ රථ සහ ඒවාට අදාළ අමතර අගෝපාංග මීට ඇතුළත් ය. *(VYRONÁ SPRÁVA O OBCHODE S VOJENSKYM MATERIÁLOM ZA ROK 2006 - 17 පිටුව)*

නමුත් වඩාත් මතභේදාත්මක අවි ගනුදෙනුවකට ස්ලොවැකියාව ඇඳෙන්නේ 2008 වසරේදී ය. 2008 අප්‍රේල් 07 වෙනිදා 'ස්ලොවැක් ස්පෙක්ටේටර්' පුවත්පතට ලිපියක් සපයන ටොම් නිකොල්සන් විසින් අනාවරණය කර තිබූ ආකාරයට යුරෝපා සංගමය විසින් පිළිගත් අවි අපනයන ආචාර ධර්මයන්ට පටහැනිව යමින් රොකට් 10,000ක් ශ්‍රී ලංකාවේ රජයට සැපයීමට ස්ලොවැකියාව එකඟ වී තිබේ. පළමුව ස්ලොවැකියාවේ සිට කොජ්ෂියාවට ප්‍රවාහනය කොට එතැනින් ශ්‍රී ලංකාවට ප්‍රවාහනය කිරීමට නියමිත මෙම අවි තොගය ශ්‍රී ලංකා යුද හමුදාව වෙත යොමු කොට තිබිණ. 2008 පෙබරවාරියේදී ස්ලොවැකියානු ආර්ථික අමාත්‍යාංශයේ අපනයන අනුමැතිය ලද මෙම අවි තොගය ''එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් වන ශ්‍රී ලංකාවට ස්වකීය ආරක්‍ෂාව සපයා ගැනීමට ඇති අයිතිය'' යටතේ සපයන ලද බව ස්ලොවැක් ජනරජයේ ආර්ථික අමාත්‍යාංශ ප්‍රකාශකයෙකු පවසා තිබිණ. පුපුරන ද්‍රව්‍ය කිලෝ 20ක්, කිලෝ මීටර් 30ක දුරක් ගෙනයාමට සමත් මිලි මීටර් 122 රොකට් උණ්ඩ, රුසියානු ග්‍රාද් මල්ටි බැරල් අවි සඳහා සඳහා යොදාගනු ලැබේ. ශ්‍රී ලංකා රජයට අයත් ලංකා ලොජිස්ටික්ස් සමාගම විසින් මේ සඳහා ඒකක මිල වශයෙන් ඩොලර් 180ක මුදලක් ගෙවනු ලැබ ඇති බව ඉහත ප්‍රවෘත්ති වාර්තාවේ දැක් වේ. ඒ ප්‍රවාහන ගාස්තු එකතු කිරීමට පෙර වටිනාකම වශයෙනි. *(Slovak rockets sold to war-torn Sri Lanka - The Slovak Spectator /07.04.2008)* යුරෝපා සංගමයේ සාමාජික රටවල් අවි අපනයනයේදී සැළකිල්ලට ගත යුතු මූලික සදාචාර පිළිවෙත් මෙම ගනුදෙනුව මගින් අමු අමුවේ උල්ලංඝණය කර ඇතැයි අවි

අපනයනයන්ට විරුද්ධ කණ්ඩායම් විසින් නිර්දය විවේචන එල්ල කළද, යුරෝපා සංගමයේ අවශේෂ රාජ්‍යයන්ගේ ප්‍රායෝගික විරෝධයකට මුහුණදීමට ස්ලොවැකියාවට සිදු නොවිණ.

අනෙක් නිදසුන ස්ලෝවේනියාවයි. පැරණි යුගොස්ලාවියාවේ කොටස්කාර රාජ්‍යයක් වූ ස්ලෝවේනියාව, 1988 වන විට යුගොස්ලාවියානු අවි නිපැයුම් කර්මාන්තයේ කේන්ද්‍රීය හවුල්කරුවෙකු වශයෙන් ඩොලර් මිලියන 220ක වාර්ෂික වටිනාකමක් සහිත අවි නිෂ්පාදනය කළ අතර සමස්ත යුගොස්ලාවියානු අවි අපනයන ආදායමින් 17%කට දායක විය. යුගොස්ලාවියාව විසිරී යාමන් පසු සාපේක්ෂ පසුබෑමකට ලක්ව තිබූ ස්ලෝවේනියානු අවි නිෂ්පාදන කර්මාන්තය 1994 -1997 දක්වා කිසිදු අපනයනය ක්‍රියාවකට දායක නොවීය. නමුත් අනතුරුව එළඹුණු දශකයේදී පැරණි යුගොස්ලාවියාවේ හවුල්කාර රාජ්‍යයන් අතරින් වේගවත්ම යුද අපනයන වර්ධනය පෙන්නුම් කොට ඇත්තේ ස්ලෝවේනියාවයි. 2004 මාර්තු 29 වෙනිදා නේටෝ සංවිධානයට ඇතුළු වූ ස්ලෝවේනියාව එම අවුරුද්දේම මැයි 01 වෙනිදා යුරෝපා සංගමයේ සාමාජික රාජ්‍යයක් බවටද පත් විය.

ශ්‍රී ලංකාව සහ ස්ලෝවේනියාව අතර සමීප රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වර්ධනය වීමට මූලපුරනු ලැබුණේ හිටපු ස්ලෝවේනියානු ජනාධිපතිවරයාගේ ශ්‍රී ලංකා සංචාරයෙනි. ජනාධිපති රාජපක්ෂගේ ඇරයුමින් 2006 පෙබරවාරි 16 වෙනිදා ශ්‍රී ලංකාවට පැමිණි එවකට ස්ලෝවේනියානු ජනාධිපති යානේස් ඩනොව්ෂෙක්, අගමැති වික්‍රමනායක මෙන්ම විදේශ ඇමති මංගල සමරවීරද හමුවී සාකච්ඡා කළේය. සාකච්ඡාවන් තුළදී අවධානයට ලක් වූ කරුණු පිළිබඳ ප්‍රසිද්ධියක් ලබා නොදුන්නද ඉන් වසර එක හමාරක් ඇතුළත ශ්‍රී ලංකා රජයට අවශ්‍ය අවි සම්පාදනයට ස්ලෝවේනියාව මැදිහත් වූ බවට වාර්තා පළ විය. 2007 නොවැම්බරයේදී අප්‍රකටව ස්ලෝවේනියාව බලා ගිය ශ්‍රී ලංකා රජයේ විශේෂ ආරක්ෂක දූත පිරිසක් විශාල අවි තොග මිලට ගැනීම සම්බන්ධයෙන් ස්ලෝවේනියානු පාර්ශ්වයන් සමග සාකච්ඡා කර තිබිණ. අදාළ ඇණවුමට යුද ටැංකි, ප්‍රහාරක අවි, උණ්ඩ සහ වෙනත් අමතර කොටස්ද ඇතුළත් විය. එක් ප්‍රහාර වටයකින් හෙක්ටෙයාර් 3ක භූමි භාගයක් විනාශ කිරීමට සමත් කිලෝ ග්‍රෑම් 256ක් පිපිරුම් බලපෑමක් සහිත රොකට් උණ්ඩ 40ක් මුදාහරින RM - 70 මිලි මීටර් 122 ජංගම මල්ටි බැරල් රොකට් ප්‍රහාරක අවි ද ඇණුවම් භාණ්ඩ අතර විය. අදාළ ප්‍රවෘත්ති වාර්තාවේ අවි සැපයුම්කාර රාජ්‍යය ස්ලෝවේනියාව වශයෙන් නිශ්චිත ලෙස දක්වා නොතිබුණද, යුරෝපා සංගමයේ සභාපති ධූරය නුදුරේදී හිමි වීමට නියමිත රාජ්‍යය වශයෙන් කර තිබූ සඳහනක් මගින් එය ස්ලෝවේනියාව බව හඟවා තිබිණ. *(New Weapons For SLA - www.lankanewspapers.com / 23.11.2007)* අදාළ ප්‍රවෘත්තිය පළ වී දෙමසක් ඇවෑමෙන් 2008 වසරේ පළමු කාර්තුව සඳහා යුරෝපා සංගමයේ සභාපති ධූරය ස්ලෝවේනියාව විසින් භාර ගත්තේය.

**බටහිර පදය සහ පෙරදිග නැටුම**

ඇත්ත වශයෙන්ම චෙක් ජනරජය, ස්ලොවැකියාව හෝ ස්ලෝවේනියාව විසින් ශ්‍රී ලංකා රජයේ හමුදාවන්ගේ යුද අවශ්‍යතාවන් සඳහා අවශ්‍ය අවි සැපයීම, අවශේෂ යුරෝපා සංගම් සාමාජිකයින්ගේ බැරෑරුම් විරෝධයට පාත්‍ර නොවීම කිසිසේත් විස්මය දනවන්නක් නොවේ. ඊට හේතු පැහැදිලි වන්නේ යුරෝපා සංගමය විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන සාමාජික රටවල අවි අපනයනය පිළිබඳ ඒකාබද්ධ වාර්තාව අධ්‍යයනය කිරීමේදී ය. 2006 වසර තුළ සිදුකළ අවි සහ ආරක්ෂණ අපනයනයන් පිළිබඳ දත්ත සම්පින්ඩණය කොට 2007 ඔක්තෝබර් 26 වෙනිදා නිකුත් කරන ලද වාර්තාව ඒ සම්බන්ධයෙන් මෙතෙක් නිකුත් කොට ඇති අවසාන වාර්තාවයි. සිව්වෙනි ඊළම් යුද්ධය ආරම්භ වූ පසු ශ්‍රී ලංකා රජය සන්නද්ධ කිරීම පිණිස යුරෝපා සංගම් සාමාජිකයන් විසින් දැක්වූ තරගකාරී දායකත්වය ඒ ඒ රාජ්‍යයන් විසින් වෙන් වෙන් වශයෙන් අනුමත කළ අපනයන බලපත්වල වටිනාකම් විමසා බැලීමෙන් මනාව සනාථ වේ. ඒ අනුව අදාළ කාල සීමාව තුළ ඔස්ට්‍රියාව විසින් අනුමත කළ ආරක්ෂණ අපනයන බලපත්වල මුළු වටිනාකම යුරෝ 14,907කි. ප්‍රංශය යුරෝ 11,60,365කි. ජර්මනිය යුරෝ 667,550කි. ඉතාලිය යුරෝ 15,716කි. බ්‍රිතාන්‍යය යුරෝ 30,27,140කි. පොදු වශයෙන් කිවහොත් යුරෝපා සංගමයේ සාමාජික රාජ්‍යයන් විසින් 2006 වසර තුළ ශ්‍රී ලංකාව සඳහා අනුමත කරන ලද ආරක්ෂණ අපනයන බලපත් 117ක ඒකාබද්ධ වටිනාකම යුරෝ 67,39,310කි. *(9th Annual Report According to Operative Provision 8 of the European Union Code of Conduct on Arms Exports - (2007/c 253/01) / **206-207 පිටු**)*

'බටහිර පදයට තවදුරටත් නොනටමු'යි දිවුරා කියා සිටින පරිසර ඇමතිවරයාගේ සිත් පැහැරගන්නා උද්වේගය නරක නැත. නමුත් යථාර්ථයන් විසින් පෙන්නුම් කරන්නේ බටහිර පදය සහ අපේ නැටුම හිතන තරම් පරස්පර නැති බව නොවේද?

**(මතු සම්බන්ධයි)**

**රවීසා**
*raveesa@googlemail.com*

*රාවය / 2008 ඔක්තෝබර් 19*